// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2156/11 - 2019 දෙසැම්බර් මස 30 වැනි සඳුදා - 2019.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමුව* : ඩීඅයිවීකේර්/එල්එන්ඩී/එල්එන්ඩී2/ඒසීකිව්යූටී/5/2.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/2/2014/එච්ඒ/219.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1134, හොරොම්බාව ග්‍රාම නිලධාරි වසමේ, හොරොම්බාව ගමේ අ.ග.පි. 210 අතිරේක අංක 26 පත්‍ර අංක 25 හි පහත සඳහන් බිම් කැබැල්ල.

01. **කැබලි අංක 263**
ඉඩමේ නම: මුතුගලවත්ත, බෝගහලන්දේ කුඹුර, කොටුවේ කුඹුර; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; හිමිකම් පාන්නා: සොයාගත නොහැක; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 11 ක්, තාවකාලික ගොඩනැගිල්ලක්, ලිං 4 ක් ජල ටැංකියක් සහ මිශ්‍ර වගාවක් ඇත, ස්ථිර ගොඩනැගිලි ඉදිකර ඇත්තේ කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසිනි; ප්‍රමාණය: හෙක්ටයාර් 1.6672.

*මායිම් :*

*උතුරට*: 6 සහ 8 වැනි බිම් කැබලි; *නැගෙනහිරට*: 6, 8 සහ 20 වැනි බිම් කැබලි; *දකුණට*: මාර්ගය (මා.සං.අ); *බටහිරට*: 6 වැනි බිම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 පෙබරවාරි මස 26 වැනි දින පෙ.ව. 10.30 ට කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2020 පෙබරවාරි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී.එච්.එම්.එන්.පී.දසනායක,
ප්‍රාදේශීය ලේකම්,
කුලියාපිටිය - නැගෙනහිර.

2019 දෙසැම්බර් මස 26 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුලියාපිටිය - නැගෙනහිර.

01 - 419

1A - G 31733 - 32 (2019/12)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: කේඑම්බී/එල්ඒඑන්/ඒසීකිව්යූඅයි/02/77.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/8/2016/එච්ජ්/367.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 331 ඒ අකුරුගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මු.පි. මාර 2802 හි පෙන්නුම් කරන පහත සඳහන් ඉඩම් කොටස,

01. **කැබලි අංක 11**
ඉඩමේ නම: සිංගප්පුලිය වත්ත හෙවත් අරඹ; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: කේ. ලියනපතිරණ, අරඹ, කහගල, අකුරුගොඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0253.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 ජනවාරි මස 27 වැනි දින පෙ.ව. 9.30 ට කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 ජනවාරි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

ආර්.එස්.සී. අබේවික්‍රම,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2019 දෙසැම්බර් මස 27 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කඹුරුපිටිය.

01 - 420

---

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වගන්තිය යටතේ දැන්වීම**

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: කේඩීඑස්/එම්බීඩී/4/2/1/45.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය: 03ජේ/92/ඩබ්එස්/352.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ අංක 1243/9 හා 2002.07.02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* III වන කොටසේ පළකරන ලද ඉඩමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0041 වශයෙන් සඳහන් වුවද එය **හෙක්ටයාර 0.0040 යනුවෙන්** සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. වික්‍රමආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2019 දෙසැම්බර් මස 18 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මැදදුම්බර.

01 - 421

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.